# දැන්වීමයි !

## අධිකරණ අමාත්‍යාංශය

### 2023 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම පිණිස සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

අධිකරණ අමාත්‍යාංශයේ වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ ලියාපදිංචි වීමට කැමති සැපයුම්කරුවන්ගෙන් (කොළඹ දිස්ත්‍රික්කය හා තදාසන්න ප්‍රදේශ තුළින්) අයදුම්පත් කැඳවනු ලැබේ.

www.moj.gov.lk යන වෙබ් අඩවියෙන් හෝ අධිකරණ අමාත්‍යාංශයේ සැපයුම් අංශය මඟින් ලබා ගත් ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සමඟ මෙම අමාත්‍යාංශයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් රු.1,000.00ක් (ආපසු නොගෙවන) ලේකම් අධිකරණ අමාත්‍යාංශය නමින් රජයේ ආදායම් ශීර්ෂ 2003.99.00 ට බැර වන සේ ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය අමුණා එවිය යුතුය. (මේ සඳහා චෙක්පත් භාර නොගන්නා බවද දන්වමි.)

අයදුම්පත් පහත නම් සඳහන් අය වෙත 2023/05/26 වෙනි දින පෙ.ව.11.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක. නැතහොත් මෙම අමාත්‍යාංශයේ පළමු මහලේ සැපයුම් අංශයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. අයදුම්පත් එවිය යුතු ලිපිනය **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අධිකරණ අමාත්‍යාංශය, නො.19, සංසරාජ මාවත, කොළඹ 10"** වේ. නියමිත දිනට සහ නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වේ.

අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ **"2023 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

සභාපති,<br>
ප්‍රසම්පාදන කමිටුව,<br>
අධිකරණ අමාත්‍යාංශය,<br>
නො.19, සංසරාජ මාවත,<br>
කොළඹ 10

**ඇගයීම් නිර්ණායක**

1. වාහන අලුත්වැඩියා කිරීම සහ සේවා කිරීම සම්බන්ධව අවම වශයෙන් රාජ්‍ය ආයතනයන් 05 කවත් ලියාපදිංචි වී තිබීම සහ එය සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කිරීම.
2. ගරාජය රක්ෂණය කර තිබේ නම් සහ එය සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කර තිබීම.
3. පුහුණු කාර්මිකයන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම සහ පරීක්ෂා කිරීම.
4. ආදායම් බදු ගෙවීම සම්බන්ධ විස්තර පරීක්ෂා කිරීම.
5. ක්ෂේත්‍ර පරීක්ෂාවේ නිරීක්ෂණ

CamScanner